astrologer.lk

Astrologer - Prabhath Karunanayaka

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 3 2 | 1 | කේ 11 | | රාකු 3 | 1 | බුගු ශුකු |
| 4 | මකර ලග්නය | ගුකුච | | ර | කුම්භ නවාංශ | 10 |
| 5 රා | ශු | බුශ ර | | 5 6 | ශ | කේ ච |

Date: XXXXX

Time: XXXX pm

Time Zone: 5:30:00 (East of GMT)

Place: 79 E 50' 00", 6 N 55' 00"

Colombo, Sri Lanka

Lunar Yr-Mo: Dundubhi - Bhadrapada

Tithi: Sukla Panchami (Gu) (33.29% left)

Vedic Weekday: Monday (Ch)

Nakshatra: Chitra (Ma) (31.98% left)

Yoga: Sukla (Ch) (84.00% left)

Karana: Balava (Ch) (66.57% left)

Hora Lord: Mangala (5 min sign: Meen)

Mahakala Hora: Mangala (5 min sign: Makar)

Kaala Lord: Sukra (Mahakala: Sukra)

Sunrise: 6:04:27 am

Sunset: 6:22:17 pm

Janma Ghatis: 25.8566 Ayanamsa: 23-35-56.75

Sidereal Time: 14:19:58

| Body | Longitude | Nakshatra | Pada | Rasi | Navamsa |
|---|---|---|---|---|---|
| Lagna | 6 Makar 39' 21.48" | USha | 3 | Makar | Kumbh |
| Surya - PK | 6 Simh 23' 50.83" | Magh | 2 | Simh | Vrish |
| Chandra - GK | 2 Tula 24' 11.43" | Chit | 3 | Tula | Tula |
| Mangala - AmK | 18 Tula 20' 46.56" | Swat | 4 | Tula | Meen |
| Budha - DK | 0 Kanya 06' 55.39" | UPha | 2 | Kanya | Makar |
| Guru - PiK | 11 Tula 14' 59.66" | Swat | 2 | Tula | Makar |
| Sukra - BK | 17 Kark 24' 36.11" | Asre | 1 | Kark | Dhanu |
| Sani - AK | 25 Kanya 15' 07.29" | Chit | 1 | Kanya | Simh |
| Rahu - MK | 17 Mith 10' 29.12" | Ardr | 4 | Mith | Meen |
| Ketu | 17 Dhanu 10' 29.12" | PSha | 2 | Dhanu | Kanya |

Vimsottari Dasa: Maha Dasas:

Mang: 1982-8-23 - 1984-11-18

Rah: 1984-11-18 - 2002-11-18

Guru: 2002-11-18 - 2018-11-18

Sani: 2018-11-18 - 2037-11-18

Budh: 2037-11-18 - 2054-11-19

Ket: 2054-11-19 - 2061-11-18

Sukr: 2061-11-18 - 2081-11-19

Sury: 2081-11-19 - 2087-11-19

Chan: 2087-11-19 - 2097-11-19

ඉදිරිපත් කිරීම -
ප්‍රවීණ ජ්‍යොතිෂවේදී ප්‍රභාත් කරුණානායක
www.astrologer.lk

33A st Lane , Rubber Watta Road, Gangodawila, Nugoda, Sri Lanka
Tel +94 771 649 203 Fax +94 112 802020
Email -info@astrologerlk.com

වර්තමානයේ පවතින ග්‍රහ තත්වය

ඔබට වසර 2002.11.18 සිට 2018.11.18 දක්වා යෙදෙන්නේ ගුරුට හිමි වු මහ දශාව වේ.එකී ගුරු මහ දශාවේම කුජට හිමි වු අන්තර් දශාව 2015.7.19 සිට 2016.6.23 දක්වා යෙදෙන අතර ඉන් පසුව 2018.11.18 දක්වා වු කාලය රාහුට හිමි වනු ඇත.

ගුරු රාහු සමඟ අටවැන්න මත යෙදෙන අතර ලග්නාධිපපති සෙනසුරු කුජ සමඟ අයස්ථානය මත යෙදේ.සෙසු ග්‍රහයන් පිලිබඳවද සැලකීමේදි ගතවන කාලය තුලදී කරන කටයුතු ආදියෙන් බලාපොරොත් වන ආකාරයේ දියුණුවක් හිමි වන බවක් නොපෙනේ.සෙනසුරු ලග්නයේ එකොලොස්වැන්න මත වුවද සඳුගෙන් දෙවැන්න මත යෙදෙන කාලය එතරම් යහපත් බවක් බලාපොරොත්තු විය  නොහැක මෙම අපලකාරී තත්වය නිසා තමන්ගේ ආදායම් මාර්ග ආදියට තරමක බාධක යෙදිය හැකියි.සිතේ තරමක අසහනකාරී තත්වයක් යෙදෙන අතර රැකියා කටයුතු නිසාද පීඩාවන් යෙදිය හැකි කාලයකි.තම තැන්පත් මුදල් වැයවීම් ,නිවාස ආදියෙහි යම් කරදරකාරී තත්වයන් ,අසනීප මෙන්ම හවුලේ කෙරෙන කටයුතු ආදියෙන් පාඩු යෙදිය හැකි අතර ඇතැම් විට දොස් ඇසිමටද සිදුවිය හැකි කාලයක් වනු ඇත.තම අසනීප ආදියෙන්ද ප්‍රවේශම් විය යුතුයි.නමුත් මෙම බාධා වීම් මධ්‍යයේ වුවද ඔබ වෙතට යම් යම් ශුභපලද හිමි වීමේ අවස්තාවන් යෙදිය හැකියි.සිතුවිලි තරමක් ආගමික කටයුතු කෙරෙහි යොමු වීමක් ඇති විය හැකියි.එසේම  මෙම තත්වයෙන් යම් ප්‍රමාණික සහනකාරී තත්වයක් 2017 ජනවාරි පමණ වන විට උදාවිය හැකියි.නමුත් ඔබ වෙත සෙනසුරු ජන්ම ඒරාෂ්ඨක තත්වයක් වසර 2025 අප්‍රෙල් 1⁀ දක්වා උදා වීමට නියමිතයි.මින් 2020 ජනවාරි 2025 අප්‍රෙල් අතර කාලය යම් බාධා වීම් මධ්‍යයේ වුවද ජීවිතයට යම් දියුණුවක් හා ජයග්‍රහණයන් හිමි විය හැකි කාලයක් වනු ඇත.

කෙසේ හෝ අපලකාරී තත්වය පවතින කාලයේදී කරන කියන් කටයුතු ,ආයොජන ,ආදියෙත් අනතුරු දායක කටයුතු මෙන්ම තම සෞඛ්‍ය තත්වය කෙරෙහිත් සැලකිල්ලෙන් කටයුතු කරන්න.එසේම මෙම අපලකාරී බවින් සහනය පිනිස පහත යෙදි ඇති වත් පිලිවෙත් භක්තිමත්ව යෙදීමෙන් ශුභපල ඉස්මතු වනු ඇති.

සමස්ත ජීවිතය.

ඔබට උසස් අධ්‍යාපනයක හිමි කම් යෙදෙනු ඇති.සමාජයේ යම් පිලිගැනිමක් යෙදේ.උසස් අධ්‍යාලයක් හිමි නොවුවද කටයුතු සඳහා යහපත් ප්‍රයෝගික ඥාණයක හිමියෙකි.ප්‍රායෝගිත දැනීම වඩාත් ජීවිතයේදී ඔබට ප්‍රයෝජනවත් වනු ඇති.සෙසු අයට උපදෙස් ලබා දෙන්නෙකි.ආහාර පාන ,ඖෂධ ,කෘෂිකර්මාන්ත ,තාක්ෂණික,මුල්‍ය කලමනාකරණ වැනි කටයුතු ඔබට වඩාත් ගැලපෙනු ඇති. කාර්යසුර්ය බවක් යෙදෙනු


33A st Lane , Rubber Watta Road, Gangodawila, Nugoda, Sri Lanka
Tel +94 771 649 203 Fax +94 112 802020
Email -info@astrologerlk.com

ඇති.ධර්මය කෙරෙහි අවබෝධයක් ඇත්තෙකි.යම් යම් කරුණු කෙරෙහි තර්කාණුකූලව සිතන්නෙකි.දුර ප්‍රදේශ ,විදේශ සමඟ කටයුතු ආදියෙන්ද වාසි යෙදිය හැකියි.පිරිස් පාලනයේ සමතෙකි.නමුත් යම් යම් අවස්ථාවලදි ඔබට හිමි වන දේ හිමි වන්නේ බාධක මැද විය හැකියි.නැතහොත් ඔබගේ සුදසුකමට සුදසු තැන හිමි වීමට කල්යාමක් යෙදිය හැකියි.ඇතැයි ලැබීම් හෝ බලාපොරොත්තු ඉටු වීම් අවසාන මොහොතේදී වෙනස් වන අවස්ථාවන යෙදිය හැකියි.ඔබට හිමි සම්පතින් ප්‍රයොජන හිමි වීමට යම් බාධාවන් යෙදෙනු ඇත.ජීවිතයේ මුල් අවධියට වඩා පසු කාලය වඩාත් යහපත් බවක් ලෙන දිය හැකියි.යාන වාහන ,ගේ දොර ඉඩකඩම් ආදියෙහි හිමි කම් යෙදෙනු ඇති.

ඔබට 2018.11.18 සිට 2037 .11.18 දකවා යෙදෙනුයේ විංශෝත්තරී සෙනසුරු මහ දශාව වේ. ( ඉහත විස්තර කර ඇත්තේ සෙනසුරු ලග්න ඒරාෂ්ඨක තත්වයයි.මේ කරුනු දෙක දෙකක් බව පැහැදිලිව අවබෝධ කරගන්න) සෙනසුරු ඔබගේ ලග්නාධිපති ග්‍රහයා වන අතර නම වැන්න තුල යෙදෙන්නේ මිතුරු බුධ සමඟිනි.නවාංශකයේ පවතින තත්වයත් සෙසු කරණුත් සලකා බැලීමේදී මෙම සෙනසුරු දශා කාලය තුලදී සමස්ත වශයෙන් දියුනුවක් හිමි විය හැකි කාලයක් බව පැහැදිලියි.සෙසු ග්‍රහ ගෝචර හා අනුදශා ආදායෙහි හීදි යම් යම් අශුභතා යම් කාලවල යෙදිය හැකි වුවද සමස්ත වසර 19 සැලකීමේදි ඔබ වෙත දියුණුවක් යෙදෙන බව පැවසිය හැකියි.මෙම දශා කාලය තුලදී ඔබ වෙත ආර්ථික මෙන්ම අධ්‍යාත්මික වශයෙන්ද දියුනුවක් යෙදෙනු ඇත.දැන පවතින සෙනසුරු ඒරාෂ්ඨක කාලයෙදීත් මෙම සෙනසුරු දශාව තුලදීත් ඔබ වෙතට යෙදෙන කරුණු ඇසුරින් ,බාධා ,සිත් වේදනා ඇසුරින් ජීවිතයට ඇති වන පන්නරය ඉදිරි ජීවිතයට යහපතක් ම වනු ඇති.මෙම සෙනසුරු දශාව නිමාවීමත් සමඟ උදාව වසර 17 වු බුධ මහ දශාව බොහෝවිට යහපත් බවක් සහනශිලි බවක් යෙදීමට නියමිතයි.

යහපත් විවාහයක හිමි කම් යෙදේ.සහකාරියද ප්‍රියමනාප රුවක හිමි කාරියකි.උගත් අයෙකි.විවාහ ජීවිතය තුල යම් යම් අවස්ථාවලදී මත ගැටීම් ආදිය යෙදනුද සමස්ත වශයෙන් යහපත් විවාහයකි.විවාහයෙන් දියුණුවක්ද සැලසෙනු ඇති.බොහෝ විට විවාහය සඳහා ප්‍රේමයේ මුල් විමක් සිදුවිය හැකියි.ගැහැණු දරුවන් සඳහා වැඩි හිමි කමක් ඔබ වෙත යෙදුනද සහකාරියේ තත්වය අනුව යම් වෙනසක් සිදුවිය හැකියි.

සතුරු කරදර ඔබ වෙත යොමු වුවද ඉන් දැඩි හානි ඔබට නොයෙදේ.

අපල සඳහා වත් පිලිවෙත්


33A st Lane , Rubber Watta Road, Gangodawila, Nugoda, Sri Lanka
Tel +94 771 649 203 Fax +94 112 802020
Email -info@astrologerlk.com

astrologer.lk
Astrologer - Prabhath Karunanayaka

1 බෝධි පුජා පවත්වා විෂ්ණු - කතරගම - සුමන සමන් - ගම්භාර - ී පත්තිනි ආදි සියලුම දෙවියන්ට පින් අනුමෝදනාකර සියලුම දෙවීන්ගේ දේව ආශීර්වාදයෙන් තම අපල දුරු වී සෙතක් ශාන්තියක් ලැබේවා යැයි ප්‍රාර්ථනා කිරීම යහපත්ය.

2 සෙනසුරාදා දිනවල උදේම ගිතෙල් මිශ්‍ර කරන ලද කිරිබත් ගුලි නමය බැගින් කපුටන්ට දන් දීම යහපති.

3 ගුණ යහපත් වැඩිහිටි අයට සුදුසු සංග්‍රහයක් කර ඔවුන්ගේ ආශීවාදය ලබා ගැනීම යහපත් ය.( වැඩිහිටි නිවාසයකට දානයක් දීම වුවත් යහපත් ය .)

4 නිල්මහනෙල් මල් හා රතු නෙලුම් බෝධියකට පුජා කරන්න.

5විෂ්ණු දෙවියන් වෙතට වසර 2037 තෙක් බාරවී බාරය වශයෙන් වර්ෂයට අළුත් කරවා ගන්න.

6 නිවසේ බුදුන් වහන්සේට මල් - සුවඳ - පහන් පුජා කර සියලුම දෙවියන්ට පිං අනුමෝදනා කර සියලුම දේවියන්ගේ ආශීර්වාදයෙන් සෙතක් ශාන්තියක් ලැබේවා යනුවෙන් ප්‍රාර්තනා කිරීම යහපත් ය.

7 නිවසේ කරණීය මෙත්ත සුත්‍රය ී,ජය පිරිත , අභිසම්භිදාන සුත්‍රය සද්ගායනා කිරීම යහපති.

8 රැකියා කටයුත්තෙන් සහනය පිනිස ගම්බාර දෙවියන් වෙත බාරයක් වන්න.බෝධි පුජා හා තෙරුවන් වෙත මල් පහන් පුජා පවත්වා ගම්බාර දෙවියන්ට පිං අන්මෝදනා කර මෙම ප්‍රශ්නයෙන් සහනය ලබා දෙනු ලෙස ප්‍රාර්තනය යහපති.

9 විෂ්ණු ,කතරගම්, ගම්බාර, සත්පත්තිනි දෙවි දේවතාවන් නිතර සිහිකරමින් තමට ආරක්ෂාව ,පිහිට ලබා දෙන ලෙස ඉල්ලා සිටින්න.

10 ඕම් ත්‍රෙයම්බකම් යජාමහේ - සුගාඩිම් පුෂ්ඨි වර්ධනං -

උරුවාරු කම්ම බන්ධනාත් - මෘත්‍යෙර් මුක්ෂීය මාමෘතාක්

අපගේ වෙබ් අඩවියෙන් මෙම ස්ත්‍රොත්‍රය ශ්‍රවණය කර නිසි උච්චාරණය දැන දවසේ ඕනෑම අවස්ථාවකදී නිසි ගෞරවය සහිතව ශිව දෙවියන් සිහිකර කියවීම සුදුසුයි.


33A st Lane , Rubber Watta Road, Gangodawila, Nugoda, Sri Lanka
Tel +94 771 649 203 Fax +94 112 802020
Email -info@astrologerlk.com

11 සෙත් කවියක් විෂ්ණු දෙවියන් කතරගම දෙවියන් සඳහා ලියවා කියවීම ශුභයි.

12ආබාධිත යාචක අයට තමාට හැකි අවස්ථා වලදී ආහාර හෝ සුදුසු යමකින් සංග්‍රහ කරන්න

13දරුවන් සිටින ආර්ථික අපහසතා ඇති පවුලකට ඔබගේ හැකි ආධාරයක් ලබා දෙන්න

14 කුඩා දරුවන් සඳහා සංග්‍රහ පැවැත්වීම ,දරුවන් ඇසුරේ සිටීම ,දරුවන් සිටින අනාත නිවාස ආදියට උපකාර ලබා දීමද සුදුයි.

"බුදු සරණින් සියලුම දෙවි පිහිටෙන් ඔබගේ සියලු අපල දුරුවී ඔබට සෙතක් ශාන්තියක් යහපතක් ම වේවා".යනුවෙන් අපිද ප්‍රාර්තනය කරමු


33A st Lane , Rubber Watta Road, Gangodawila, Nugoda, Sri Lanka
Tel +94 771 649 203 Fax +94 112 802020
Email -info@astrologerlk.com